පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක -: 2011/11

එන්සිපි/සිඑස්/පිටි/ඒපි/එෆ් එම්/06/01
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,අනුරාධපුර.
2011.11.14

සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ,
පළාත් සභාවේ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානින්.

## 2011 වර්ෂයේ භාණ්ඩ සහ වත්කම් සමීක්ෂණය

උතුරු මැද පළාත් සභාවේ සෑම අමාත්‍යාංශයකම /දෙපාර්තමේන්තුවකම සහ ඊට අනුබද්ධ කාර්යාලවල ඇති සියලුම භාණ්ඩ සහ වත්කම් වාර්ෂික සමික්ෂණයකට ලක්කිරීම කළයුතු බවත් ,සෑම ගණන්දීමේ නිළධාරියෙක් විසින්ම අදාළ භාණ්ඩ හරි වැරදි බැලීම සඳහා සමික්ෂණ මණ්ඩලයක් සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වන දිනට පෙර පත්කළ යුතු බවත් පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයේ රී 476 වගන්තියේ දක්වා ඇත.

02. ඒ අනුව 2011 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඔබ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ / කාර්යාලය සතුව ඇති භාණ්ඩ සහ වත්කම් පිළිබඳ සමික්ෂණයක් කළ යුතු බැවින් ඒ සඳහා නිළධාරින් තිදෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් 2011.12.15 වන දිනට පෙර පත් කිරීමටත් එම සමික්ෂණ මණ්ඩලයට අදාළ උපදෙස් ලබා දි කාර්යයන් පැවරිමටත් කරුණාකර කටයුතු කරන්න.

03. සෑම සමික්ෂණ මණ්ඩලයක්ම නිළධාරින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එම තිදෙනා අතුරින් ජ්‍යෙෂ්ඨතම නිළධාරියා එම මණ්ඩලයේ සභාපති විය යුතුය. මෙම මණ්ඩලයට වෙනත් අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / කාර්යාලයක නිලධාරියකු අවම වශයෙන් පත් කර ගත යුතුය. කාර්මික භාණ්ඩ හෝ විශේෂිත තාක්ෂණික ස්වරූපයේ භාණ්ඩ සමික්ෂණයට ඇත්නම් එවැනි භාණ්ඩ පිළිබඳ දැනුම ඇති නිළධාරියෙකු සමික්ෂණ මණ්ඩලයට ඇතුලත් කර ගැනිමටත් ගබඩා භාර නිළධාරින් සමික්ෂණ මණ්ඩලයට පත් නොකර භාණ්ඩ සමික්ෂණ කටයුතු සඳහා ඔවුන්ගේ සහාය ලබාගැනිමටත් කටයුතු කළ යුතුය.

04. භාණ්ඩ සමීක්ෂණය සඳහා බඩු ලේඛන පොත් සමික්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර මුල්‍ය රීති සංග්‍රහයේ රී 476 ප්‍රකාරව බඩු ලේඛන පොත් තුළනය කල යුතුය. එම බඩු වට්ටෝරු පොත්ද රී 561 හි සඳහන් වත්කම් ලේඛනද සමික්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කරන

පොත්පත් / ලේඛනවල සඳහන් භාණ්ඩ සහ ඊට අදාළ වත්කම් භෞතිකව පරීක්ෂා කර බලා හ.ග.ප. 66 දරණ ආකෘතියේද, සමීක්ෂණයේදී අනාවරණය වන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ පිළිබඳව පොදු 47 දරණ ආකෘතියේද, පිටපත් 04 කින් යුතුව සම්පූර්ණ කර 2012 පෙබරවාරි 15 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිටද පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

05. ඔබ විසින් අංක 2008/3 හා 2008.01.08 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව දැනටමත් සකස් කර ඇති පළාත් සභාව සතු වත්කම් ලේඛන යාවත්කාලින කර මෙම සමීක්ෂණයේ දි භෞතිකව සමීක්ෂණය කරවා ගැනීම සුදුසු වන අතර වත්කම් හඳුනා ගැනීම සඳහා එම චක්‍රලේඛයේ අමුණා ඇති අංක 01 ඇමුණුමේ සඳහන් සංකේත භාවිතා කළ යුතුය. භාණ්ඩ සමීක්ෂණය සඳහා භාවිතා කරන ලෙස උපදෙස් දී ඇති ඉහත සඳහන් ආකෘති පත්‍ර වල භාණ්ඩ හෝ ද්‍රව්‍ය පිළිබඳ විස්තර දැක්වීමට ඇති තීරුවට පෙර සංකේත අංක දැක්වීම සඳහා තීරුවක් වෙන් කර අදාළ අයිතමයේ සංකේත අංක දැක්වීම තුළින් අයිතම හඳුනා ගැනීමේ ව්‍යාකූලතාවයන් අවම කරගත හැකිවේ.

06. සෑම සමීක්ෂණයක් අවසානයේ දීම ගණන්දීමේ නිළධාරින් වෙත ලබාදෙන වාර්තාව පදනම් කරගෙන වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ සම්බන්ධව 2012.06.30. දිනට පෙර මුල්‍ය රීති සංග්‍රහයේ රී 490 ප්‍රකාරව ක්‍රියා කර මටද පිටපතක් සහිතව විගණකාධිපති වෙත වාර්තා කිරීමට කරුණාකර කටයුතු කරන්න.

07. මෙම චක්‍රලේඛය හා ඉහත සඳහන් පෝරම www.ncp.gov.lk දරණ වෙබ් අඩවියේ අන්තර්ගත කර ඇත.

08. මෙම චක්‍රලේඛය ලද බව කරුණාකර සනාථ කරන්න.

**ඩබ්ලිව්.ජේ.දයානන්ද**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත් :-

1. සියලු ප්‍රාදේශිය ලේකම්වරු, - දැ.පි.
2. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - සම්බන්ධිකරණය කිරීම සඳහා
3. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - දැ.පි.
4. විගණකාධිපති - දැ.පි.